විශ්‍රාම වැටුප් චක්‍රලේඛ: 01/2022

මගේ අංකය : විවැ.චක්‍රලේඛ/2022
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,
මාළිගාවත්ත,
කොළඹ 10.
2022.01.20

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිස්ත්‍රික් ලේකම්වරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන්,

**විශ්‍රාමිකයින්ට රු.5,000/- ක මාසික දීමනාවක් ලබා දීම**

2022.01.13 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2022 වෙත ඔබගේ අවධානය යොමු කරවමි. 2022.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි විශ්‍රාම වැටුප් ගණනයට අදාළ කර නොගන්නා රු.5,000/- ක මාසික දීමනාවක් විශ්‍රාමිකයින්ට ගෙවීමට කටයුතු කරනු ඇත.

02. 2022 ජනවාරි මස සිට සියලු විශ්‍රාමිකයන්ට මෙම දීමනාව හිමි වේ. මෙම දීමනාව ගෙවීම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මඟින් සිදු කරනු ලබන අතර, එය 2022 පෙබරවාරි මස විශ්‍රාම වැටුප සමඟ ගෙවීම් ආරම්භ කර ලබා දීමට කටයුතු කරනු ලැබේ. දීමනාව ලබාදීමේදී පහත උපදෙස් පිළිපැදිය යුතු ය.

I. කිසියම් තැනැත්තෙකු විශ්‍රාම වැටුප් කිහිපයක් හෝ විශ්‍රාම වැටුප සමග වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුපක් හෝ ලැබුව ද එවැනි තැනැත්තෙකුට හිමිවනුයේ ද මසකට රු.5,000/- ක එක් දීමනාවක් පමණි.

II. වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප ලබන දැනටමත් රජයේ සේවයේ නියුතු නිලධාරියෙකුට, වැටුප සමග මෙම රු.5,000/- දීමනාව හිමි වන විට විශ්‍රාම වැටුප සමග මෙම දීමනාව හිමි නොවේ.

III. ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් දුබලතාවයට පත්ව වයස අවුරුදු 55 දක්වා වැටුප් ලබන හෝ මියගිය ත්‍රිවිධ හමුදා හා පොලිස් නිලධාරීන් වෙනුවෙන් ඔවුන්ගේ වයස අවුරුදු 55 දක්වා වැටුප් හිමි වන යැපෙන්නන්ට ද විශ්‍රාම වැටුප සමඟ මෙම දීමනාව හිමි නොවේ.

IV. විදේශගත විශ්‍රාමිකයන්ට මෙම දීමනාව හිමි නොවේ.

V. නැවත විවාහයට පත්ව විශ්‍රාම වැටුපෙන් 50% ක් ලබන වැන්දඹුවන්ට හිමි වන්නේ දීමනාවෙන් 50% ක් නැතහොත් අඩක් පමණි.

VI. ප්‍රතිලාභීන් කිහිප දෙනෙකු වෙත බෙදා ගෙවන (අනත්දරු විශ්‍රාම වැටුප) විශ්‍රාම වැටුපට මෙම දීමනාව හිමිගැන්වීමේ දී අදාළ ප්‍රතිශතය අනුව ගෙවීමට කටයුතු කළ යුතුය.

VII. දීමනාව හිමිගැන්වීමේ දී විශ්‍රාමිකයා ජීවත්ව සිටින බවට තහවුරු කර ගත යුතුය.

03. ඉහත කරුණු තහවුරු වන විශ්‍රාමිකයන්ට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් රු.5,000/- දීමනාව ගෙවීම ආරම්භ කරනු ලැබේ.

04. නැවත සේවයේ යොදවා ඇති විශ්‍රාමික නිලධාරීන්ට වැටුප සමග දීමනාව හිමි නොගන්වන බැවින් ඒ බව තහවුරු කර විශ්‍රාම වැටුප සමග දීමනාව හිමිගැන්වීම සඳහා ඉල්ලීමක් විශ්‍රාමිකයාගේ විශ්‍රාම වැටුප් ගෙවීම කළමනාකරණය කරන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත යොමු කළ යුතුය.

05. මෙම දීමනාව හිමි විය යුතු, එහෙත් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් දීමනාව ආරම්භ කර නොමැති විශ්‍රාමිකයකු වෙනුවෙන් දීමනාව හිමි ගැන්වීම සඳහා අදාළ ඉල්ලීම Arrears Source Document හරහා ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.

06. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් මෙම දීමනාව හිමිගන්වා ඇති, එහෙත් ඉහත කොන්දේසි අනුව දීමනාව හිමි නොවන අයකු වෙතොත්, මෙම දීමනාව ගෙවීම වහාම නතර කළ යුතුය.

07. වැඩිපුර ගෙවීමක් සිදු ව ඇත්නම් අයකිරීමට ද කටයුතු කළ යුතු ය.



**ඒ.ජගත් ඩී.ඩයස්**
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් :

| | | |
|---|---|---|
| 01. | ජනාධිපති ලේකම් | - කරු.දැ.ගැ.ස |
| 02. | අග්‍රාමාත්‍ය ලේකම් | - කරු.දැ.ගැ.ස |
| 03. | ලේකම්, මුදල් අමාත්‍යාංශය | - කරු.දැ.ගැ.ස |
| 04. | ලේකම්, රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | - කරු.දැ.ගැ.ස |
| 05. | විගණකාධිපති | - අ.ක.ස |